ක්‍රමලේඛන ව්‍යාපෘති සකස්කිරීමේ පහසුකම් ව්‍යාපෘතිය - 2020
---------------------------------------------------------------

ක්‍රමලේඛන ව්‍යාපෘති සකස්කිරීමේ පහසුකම් ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව (ලෝක බැංකුව) අතර 2018 ජනවාරි 30 දින එළඹි මූල්‍ය ගිවිසුම් අත්තිකාරම් අංක : පී - 4910 හි 2 වැනි පරිච්ඡේදයේ 2.05 (ඇ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය
---------------------------------------------------------------------

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම් අත්තිකාරමට අනුව, එවකට මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පැවති, වර්තමානයේ මුදල් අමාත්‍යාංශය යටතේ පවතින ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යන අමාත්‍යාංශයන්, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයන් වේ. ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන ව්‍යාපෘති වෙනුවෙන් වූ මූලික පහසුකම් සැලසීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ණය දෙන නියෝජිතායතනය මගින් මූල්‍යාධාර සැපයීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. මූල්‍ය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 4.00 කට සමාන රුපියල් මිලියන 636 ක් වූ අතර, ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව විසින් එම අරමුදලේ සම්පූර්ණ වටිනාකම මූල්‍යනය කිරීම සඳහා එකඟ වී තිබුණි. මෙම ව්‍යාපෘතිය එහි කටයුතු 2018 ජනවාරි 30 දින ආරම්භ කරන ලද අතර, 2020 ජනවාරි 20 දින වනවිට අවසන් කිරීමට නියමිතව ඇත.

## 1.3 මතය
------

මාගේ මතය අනුව මේ සමඟ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනයන් තුළින්, 2020 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ මතයක් පිළිබිඹු කෙරෙන අතර, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වියදම් පිළිබඳ ප්‍රකාශය සහ ඊට අදාළ මුදල් ප්‍රවාහයන් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කර ඇත.

## 1.4 මතය සඳහා පදනම
--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් වන විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත වන බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම
----------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇති වීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. භෞතික කාර්යසාධනය

2.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

| අංකය | සංරචකය | විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ)<br>(ආ)<br>(ඇ)<br>(ඈ)<br>(ඉ)<br>(ඊ) | රාජ්‍ය අංශය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය<br>වේලි ආරක්ෂණය හා ජල සම්පත් සැලසුම් කිරීමේ ව්‍යාපෘතිය<br>පළාත්බද මාර්ග සංවර්ධන වැඩසටහන<br>ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය<br>ප්‍රාදේශීය සංවර්ධනය සඳහා සහාය වීමේ වැඩසටහන<br>අහිතකර දේශගුණික බලපෑම්වලට යෝග්‍ය කෘෂි - වාරි සංවර්ධන ව්‍යාපෘතිය<br>පෞද්ගලික රාජ්‍ය හවුල්කාරිත්වයට අවශ්‍ය ආයතනික හා නෛතික රාමු සවිබල ගැන්වීම. | 2017 සිට 2019 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ මූල්‍ය ආධාර සැපයීම තුලින් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ව්‍යාපෘති 09 ක් සඳහා පහසුකම් සැලසීම, ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වුවද, 2018 වර්ෂය තුලදී එම ව්‍යාපෘති වලින් ව්‍යාපෘති 03 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා මූලික පහසුකම් සැලසීමේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ කටයුතු පෙර වර්ෂය තුලදී ආරම්භ කර තිබුණු අතර,වේලි වල ආරක්ෂාව සහ වේලි හා වාරි ජලය බෙදා හැරීමේ ඇළ මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම පිළිබඳව වූ ගිවිසුම, 2021 වර්ෂය තුලදී අත්සන් කර තිබුණි. තවද, රජයේ ප්‍රතිපත්ති වල ප්‍රමුඛතාවයන් වෙනස්වීම හේතුවෙන් විදේශ අරමුදල් සැපයීමට අපේක්ෂිත විදේශ ව්‍යාපෘති 05 ක ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර නොතිබුණි. | එකග වේ.<br>රජයේ ප්‍රතිපත්ති වල ප්‍රමුඛතාවයන් වෙනස් වීම හේතුවෙන් විදේශ අරමුදල් සැපයීමට අපේක්ෂිත විදේශ ව්‍යාපෘති 05 ක කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකිවී තිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු ව්‍යාපෘති කාලය තුලදී සාක්ෂාත් කරගැනීම සඳහා පියවර ගත යුතු වේ. |

## 2.2 උපයෝජනය නොකරන ලද සම්පත්

| විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| ණය නියෝජිතායතනය මගින් ලබා දෙන මුළු ප්‍රතිපාදනය වූ එක්සත් ජනපද ඩොලර් මිලියන 04 කට සමාන රුපියල් මිලියන 636 කින්, එක්සත් ජනපද ඩොලර් මිලියන 0.39 කට සමාන රුපියල් මිලියන 87.6 ක මුදලක් නියෝජනය කරනු ලබන, සියයට 9.75ක ප්‍රමාණයක් පමණක් 2020 දෙසැම්බර් 31 දින වනවිට උපයෝජනය කර තිබුණු අතර, උපයෝජනය නොකොට ඉතිරි වූ ශේෂය, ණය ලබා දුන් නියෝජිත ආයතනය වෙත නැවතත් ආපසු ගෙවා තිබුණි. | එකඟ වේ. | වඩාත් ඵලදායී ආකාරයකට අරමුදල් උපයෝජනය කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක් සකස් කළ යුතු වේ. |

## 2.3 මතභේදයට තුඩුදුන් කරුණු

| විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| ඒකාබද්ධ ජලාධාර හා ජලසම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකක කාර්යාලය රුපියල් මිලියන 7.6ක් වැය කොට නවීකරණය කර තිබුණද, පසුව එම ව්‍යාපෘති කළමනාකරණ ඒකක කාර්යාලය වෙනත් ස්ථානයක ස්ථාපිත කොට තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉහත සඳහන් කර ඇති වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | අමාත්‍යාංශය සතු වූ ඉඩකඩ ප්‍රයෝජනයට ගනිමින්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය අමාත්‍යාංශ පරිශ්‍රය තුළ පිහිටුවාගෙන තිබුණි. පසුව, රජයේ ප්‍රතිපත්ති වලට අනුකූල වීම හේතුවෙන් ඇතිවූ අවශ්‍යතා වෙනස්වීම මත පදනම්ව, උක්ත ව්‍යාපෘතියේ කළමනාකරණ ඒකකය අමාත්‍යාංශයට අයත් වෙනත් ස්ථානයක ස්ථාපිත කරන ලදී. | ව්‍යාපෘතියේ විෂය පථයට අනුකූල වන පරිදි, ව්‍යාපෘතියේ මූල්‍ය කළමනාකරණ කටයුතු කාර්යක්ෂමව හා වියදම් අවම කර ගනිමින් ඉටු කළ යුතු වේ. |